**2015 ජනවාරි 8 රටේ සිදුවූ ඓතිහාසික දේශපාලන වෙනසට දායකත්වය සැපයූ කලාකරුවන් අතර පරාක්‍රම නිරිඇල්ලද ප්‍රමුඛයෙකි. කලක් තිස්සේ "ජන කරළිය" මගින් ජාතීන් අතර සංහිඳියාව සඳහා වන සංස්කෘතික මැදිහත්වීමක නිරතව සිටින ප්‍රවීණ නාට්‍යවේදී/සිනමාවේදී පරාක්‍රම නිරිඇල්ල සමඟ මේ සංවාදය ගොඩනැඟෙන්නේ ජනවාරි 8 දේශපාලන වෙනසේ දෙවර්ෂ පූර්ණය සහ ශිෂ්ඨ-සම්පන්න ජන සමාජයක් ගොඩනැඟීම සඳහා වන ඔහුගේ දායකත්වයේ නව ප්‍රවේශය වන හුණුවටය නාට්‍යයේ දෙමළ පරිවර්තනය වේදිකාගත කිරීම මුල්කරගනිමිනි.**



# පුරවැසියන් පාරට බැස දේශපාලන වෙනස සිදු කළ යුතුයි

ප්‍රවීණ නාට්‍යවේදී/චිත්‍රපට අධ්‍යක්ෂ

## පරාක්‍රම නිරිඇල්ල



සංවාදය සහ ඡායාරූප
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

**'ජනවාරි 8' දේශපාලන වෙනසට සෘජුව දායකත්වය සැපයූ කලාකරුවෙක් විදිහට අද මොකද ඔබට ඒ ගැන හිතෙන්නේ ?**
රටේ ඉතාම හොඳ දේශපාලන වෙනසක් කරන්නට ලැබුණු අවස්ථාවක් ඒක. වහාම පාර්ලිමේන්තු මැතිවරණයකට ගිහිල්ලා හොරු ටික එළවලා දාලා හොඳ වෙනසක් කරන්න ලැබුණු අවස්ථාවක්. ඒක එහෙම පිටින්ම කෑවා. නැති කළා. මොකක්ද මේ මිනිහ කළ කැත වැඩේ. දැන් මිනිස්සු අපෙන් අහන ප්‍රශ්නවලට අපිට කට උත්තරත් නෑ. වෙනසක් වුණා කියා ශත පහක වැඩක් නෑ. බලවේගයක් හැටියට කලාකාරයෝ සිවිල් සමාජය ඔක්කොම පාරට බැහැලා මේක වෙනස් කරන්න ඕනේ. එහෙම නැති වුණොත් මේ සියල්ල මෙතනින් ඉවර වෙයි. මම දැන් කිසිම දේකට යන්නේ නෑ. දාරියෝ ෆෝගේ නාට්‍යයක් අපි කළානේ වරෙන්තු කියලා. ඒකේ කියනවා ''පවතින ආණ්ඩුව දූෂිත නම් ආණ්ඩුව මිනීමරණ-කොට, ඒකේ ඉන්න මැති ඇමැතිවරු වංචා දූෂණ සිද්ධ කරනකොට ජනතාව ජීවිතය පරදුවට තියලා ඒ ආණ්ඩුව පෙරළලා දානවා. ඊට පස්සේ අලුත් ආණ්ඩුවෙන් බලාපොරොත්තු වෙනවා අලුත් ප්‍රතිසංස්කරණ කරලා අර ගසා කාපු සල්ලි ගෙනැල්ලා සහන සලසයි කියලා. නමුත් එහෙම වෙන්නේ නෑ. ඇයි ඒ ? දේශපාලකයෝ වේදිකාවල කතා කරන මත වලට වැඩිය ධනේෂ්-වරය ඝනයි.''

**ජනවාරි 8 වෙනසින් පසුව ඔබට ජනාධිපති-අගමැති හමුවෙන්නට, කතාබහ කරන්නට කිසියම් හෝ අවස්ථාවක් ලැබුණද?**
එක සැරයක් පාර්ලිමේන්තුවට ගෙන්නුවා ඉදිරියට හදලා ගිහින් ඒක බලලා හැදෙන්න ඕනේ විදිහ ගැන උපදෙස් දෙන්න කියලා. ඉතිං අපි ඒ විදිහට අවශ්‍ය උපදෙස් දුන්නා. තිබුණු ප්ලෑනේ වෙනස් කම් වගේකුත් කළා.තරුණයන්ට බ්ලැක් බොක්ස් තියටර් එකක් හදන්න ප්ලෑන් කරලා තිබුණා. ඒකේ අඩුපාඩු වගයක් තිබිලා අපි ඒවත් පෙන්නලා දුන්නා. ඔහොම වැඩේ කරගෙන යනකොට උන්හිටි ගමන් අපිට පාර්ලිමේන්තුවට එන්න කියලා කිව්වා. ගියාම මෙන්න අගමැතිතුමා කියනවා ජෝන් ද සිල්වා එක පාලනය කරන්න දෙන්නේ නේවි එකට



කලා අංශය වෙනුවෙන් කෙරෙන්න ඕනේ දේවල් කතා කරන්න.

**කොහොමද ලැබුණු ප්‍රතිචාර ?**
මැතිවරණයට කලින් අපි ඉදිරිපත් කළ යෝජනා වගයක් තිබුණා කලා ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාළව. මම ඒ ලේඛනත් අරගෙන ගියා. එතකොට කිව්වා ජෝන් ද සිල්වා රඟහල හදන්න ඕනේ ඕනේ කියලා. ක්ෂේත්‍රයේ අයගෙන් කමිටුවක් කියලා. අපි කිව්වා දැන් නෙළුම් පොකුණත් පාලනය කරන්නේ නේවි ඒකනේ කියලා. ඔව්, එහෙම නැතිව මේව කරන්න සල්ලි නැතිලු. මම කිව්වා ඒක හරි නෑ අපිට ඒකට එකඟ වෙන්න බෑ කියලා. එතකොට කියනවා නෑ ඒක දැන් තීරණය කරලා ඉවරයිලු. වෙන මිනිහෙක් වුණානම් මම කණාට ගහලා එන්නේ. ඊට පස්සේ අපි මේවා ප්‍රශ්න කරන නිසා ඒක වෙනමම කණ්ඩායමකට බාර දුන්නා. ඔහොම තමයි කටයුතු වෙන්නේ.

**'ජනවාරි 8' දේශපාලන වෙනසට දායකත්වය සපයමින් මෛත්‍රීපාල සිරිසේන පොදු අපේක්ෂක-යාගේ ජයග්‍රහණය වෙනුවෙන් ඔබ දායකත්වය සපයන්නේ මොනවගේ පසුබිමකද ?**
මෛත්‍රීපාල සිරිසේන මහත්තයා පොදු අපේක්ෂකයා වෙන බව මට දැනගන්න ලැබුණේ මම නාට්‍ය උත්සවයකට ආමේනියාවලට ගිහින් ඉන්න කොට. ලංකාවට ආවට පස්සේ ගාමිණී වියන්ගොඩ මට ඇවිත් කිව්වා මේ වෙලාවේ රටේ වෙනසක් වෙන්න ඕනේ, ඒ නිසා අපි වේදිකාවට නගින්න ඕනේ කියලා. මම කිව්වා හරි. හැබැයි අපි කලාකාරයෝ විදිහට වේදිකාවට නැගලා මේ අයව පත්කරලා නිකන් ඉන්නවද? කලාවේ අවශ්‍යතා ගොඩක් තියනවා කිසිම ආණ්ඩුවකින් නොකෙරෙන. කලාක-ාරයෝ ඡන්ද කාලෙට වේදිකාවට ගොඩවෙලා ආ-ණ්ඩු පත් කරනවා. නමුත් ඡන්දය ඉවර වුණාට පස්සේ මුකුත් නැහැ. ක්ෂේත්‍රයේ ප්‍රශ්න එහෙමමයි. ඒ නිසා අපි වේදිකාවට නඟිනවා නම් ක්ෂේත්‍රයේ තියන ප්‍රශ්න ලැයිස්තුවක් හදලා, බලයට ආවට පස්සේ ඒවා විසඳන බවට මෙයාගෙන් අස්සනක් ගමු කියා. වියන්ගොඩ ඒකට කැමැති වුණා. ඊට පස්සේ කරුණු 14ක් ඇතුළත් කරලා අපි හැදුවා ජාතික සංස්කෘතික ප්‍රතිපත්තියක්. එහි පළමු කරුණ තමයි සංස්කෘතික අමාත්‍යාංශය රටේ ප්‍රමුඛ අමාත්‍යාංශයක් වෙන්න ඕනේ කියන එක. එයට දෙන ප්‍රතිපාදන වැඩි කරන්න ඕනේ. ධර්මසිරි බණ්ඩාරනායකයි කේ.බී. හේරතුයි මමයි ලූෂන් බුලත්සිංහලයි අපි කට්ටිය අස්සන් කරලා මේක ගිහින් මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට දුන්නා. එයා ඒක කියෙව්වා. ඒ වෙලාවෙ කිව්වා සංස්කෘතික අමාත්‍යාංශයට හැමදාම පත්වෙන ඇමැතිවරුන් ඒ ගැන දන්න අය නෙවෙයි. ඒ නිසයි වැඩක් වෙන්නේ නැත්තේ කියලා ඒකට අස්සනුත් කළා මම මෙය ක්‍රියාත්මක කිරීමට එකඟ වෙමි කියලා. ඊට පස්සේ තමයි මම වේදිකාවට නැග්ගේ.

**ඒ පොරොන්දුවවත් ජනාධිපතිවරයා ඉටු කළාද ?**
අනිත් දේවල් කළා වගේ තමයි. ඉස්සෙල්ලම කළේ අපි බලාපොරොත්තු නොවුනු විදිහට සංස්කෘතික අමාත්‍යාංශය දෙකට කඩපු එක. සම්පූර්ණයෙන්ම විකෘතියක් කළේ. රටක් සංවර්ධනය වෙනවා නම් සංස්කෘතික සංවර්ධනයකුත් විය යුතුයි. එසේ වෙනවා නම් ඒ සඳහා නිර්මාණ කලාවන් භාවිතා කිරීම ඉතාම අත්‍යාවශ්‍ය දෙයක්. ඒක විතරක් කරලා හරියන්නෙත් නෑ. දැන් මෙගා පොලිස් පටන් ගන්නවා. මහා නගර සංවර්ධනය. ඒත් නගරය ඇතුළේ පුස්ථකාලයකට ඉඩක් නැත්නම්, නාට්‍යයක් බලන්න, විනෝද වෙන්න තැනක් නැත්නම්, සාකච්ඡා කරන්න සම්මන්ත්‍රණ පවත්වන්න තැනක් ඒ මෙගා පොලිස් ඇතුළේ නැත්නම් ඒ සංවර්ධනය කාටද? ඒ සංවර්ධනය භුක්ති විඳින මිනිසාගේ අභ්‍යන්තරය ගොඩනැඟෙන්නේ කොහොමද? ඒකට ඕනේ කරන වැඩපිළිවෙළක් නැතිව ඒ දේවල් සිදු වෙන්නේ නෑ.

**'ජන කරළිය' මගින් හුණුවටයේ කතාව දෙමළ පරිවර්ථනයක් ලෙස වේදිකාවට ගෙන ඒම සමා-ජයේ යම් කිසි ආකාරයක විශේෂ අවධානයට ලක්ව තිබෙනවා. කොහොමද මේ කටයුත්ත සිදුවෙන්නේ ?**
හෙන්රි ජයසේන මහත්තයා හුණුවටයේ කතාව නිෂ්පාදන කරන්නේ බර්ට්‍රෝල් බ්‍රෙස්ට්ගේ නාට්‍ය පරිවර්ථනයකින්. ඔහු කැමති වුණා ඒ නාට්‍ය ජන කරළියෙන් නිෂ්පාදනය කරනවාට. 2008දි අපි ගිවිසුමක් අස්සන් කරලා ඒ පිටපත අරගත්තා. 2013 එම නාට්‍යයම අපි නැවත නිෂ්පාදන කළා. ඔය අතරේ 2010 අපි යාපනේ ගියා. යාපනේ ඉන්නවා ප්‍රවීණ නාට්‍යකරුවෙක්. ආචාර්ය පුලන්දෙ එම්. ෂන්මුගලිංගම්. ඔහුයි දෙමළ භාෂාවෙන් නාට්‍ය නිෂ්පාදනය කරන ලංකාවේ ඉන්න ප්‍රවීණතමයා. මට දැනගන්න ලැබුණා ඔහු බටහිර නාට්‍ය පිටපත් කිහිපයක්ම පරිවර්ථනය කරලා ලංකාවේ නාට්‍ය ඉගෙන ගන්න අයට ඒ අත්පිටපත් යාපනය විශ්වවිද්‍යාලයට බාරදීලා එහි සුරක්ෂිතව තිබෙනවා කියලා. ඒ අතරේ හුණුවටයේ කතාවේ බ්‍රෙස්ට්ගේ නාට්‍ය පිටපතත් පරිවර්ථනය කොට තිබෙන බව මට දැනගන්න ලැබුණා. මම කැමති වුණා එය දෙමළ භාෂාවෙන් නිෂ්පාදනය කරන්න. නමුත් ඒකට අපිට ප්‍රතිපාදන තිබුණේ නෑ. ඒ නිසා සිංහල හුණුවටය තමයි දිගටම කළේ. නමුත් ඒ කරද්දි අපි ක්‍රමයෙන් හෙන්රි ජයසේන මහතාගේ හුණුවටයේ පිටපත අත්හැරියා. මුල් පිටපත නැවත පරිවර්ථනය කර වෙනම නිෂ-'පාදනයක් ලෙස කළා. මොකද 1967 කාලේ අපේ රටේ යුද්ධයක් හෝ යුද්ධයක අත්දැකීම් නොතිබුණු නිසා හෙන්රි ජයසේන මහතා බ්‍රෙස්ට්ගේ මුල්පිටපතේ ඇති බොහෝ දේ අතහැර තිබුණා. නමුත් බ්‍රෙස්ට්ගේ පිටපතේ මූලිකව සාකච්ඡාවී තිබුණේ යුදමය පරිසරයක්. හෙන්රි ජයසේන මහතා අරගෙන තිබුණේ එහි සරළ